# 2012 වර්ෂය සඳහා රාජ්‍ය ආයතන විසින් වාර්ෂික වාර්තා සහ වාර්ෂික ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.

************

JSC/SEC/Annual Report/2012 E&O/AC/AO/විවිධ 2013.09.09

ජනාධිපති ලේකම්,
ජනාධිපති කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

**<u>රාජ්‍ය ආයතන විසින් වාර්ෂික වාර්තා සහ</u>**
**<u>වාර්ෂික ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම - 2012</u>**

ඉහත කරුණට අදාල ඔබගේ සමාංක හා 2012.09.14 දිනැති ලිපිය හා සබැඳේ.

ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ 2012 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් වාර්තාව භාෂාත්‍රයෙන් වෙන වෙනම සකස් කර මේ සමඟ ඔබ වෙත එවමි.

සිසිර රත්නායක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

| <u>**පටුන**</u> | <u>**පිටු අංක**</u> |
| --- | --- |


1. 2012 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 01-08

2. 2012 වර්ෂයට අදාල වාර්ෂික ගිණුම් වාර්තාව 09-16

3. 2012 විසර්ජන ගිණුම් සඳහා විගණකාධිපතිගේ නිරීක්ෂණ 17-20

4. එම විගණන නිරීක්ෂණ සම්බන්ධ පිළිතුර 21-26

5. ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක් 27

6. විගණන විමසුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග 28

7. ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශයක් 29


*************

# <u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය සහ කාර්යභාරය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඇ ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථය වේ. අග්‍ර විනිශ්චයකාරවරයා නිල බලයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් ජනාධිපතිවරයා විසින් සාමාජිකයන් ලෙස පත් කරනු ලබයි. අධිකරණ සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු පත්කරනු ලබන අතර, ඔහු හෝ ඇය මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් පත්කරනු ලබන්නේය.

02. 2012 වර්ෂයේ අධිකරණ සේවා කොමිෂන් සභාව සමන්විත වූයේ සභාපති වශයෙන් ගරු අග්‍රවිනිශ්චයකාර ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මැතිණියද, ගරු ආර්.ඒ.එන්.ගාමිණී අමරතුංග මැතිතුමා සහ ගරු එස්.අයි.ඉමාම් මැතිතුමා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සාමාජිකත්වයෙන් යුතුවය. 2012 වර්ෂයේ කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් 2012 ජනවාරි මස සිට 2012 අප්‍රේල් මස 11 වන දින දක්වා සුදත් එන්.ගොපල්ලව මහතාද, 2012 අප්‍රේල් මස 12 වන දින සිට මංජුල තිලකරත්න මහතාද කටයුතු කරන ලදී. (මේ වනවිට සුදත් එන්.ගොපල්ලව මහතා මහාධිකරණ විනිශ්චයකාරවරයකු වශයෙන් පත්කරනු ලැබ සිටී.) කොමිෂන් සභාවේ ලේකම්වරයාට සහායවීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් එම්.එම්.එම්.මිහාල් මහතා සහ එන්.ඩී.බී.ගුණරත්න මහතාද කටයුතු කරන ලදී.

03. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩලය, කාර්යාල කළමනාකරණයෙහි ලා පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ තුනකට බෙදා, එකී අංශ මගින් පරිපාලන කාර්ය භාරයන් පවත්වාගෙන යන ලදී.

01. ලේකම් අංශය
02. නියෝජ්‍ය ලේකම් අංශය
03. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් අංශය.

04. 2012 වර්ෂය තුල අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් සේවාවන්ට අයත් සේවා මණ්ඩලයකින් සමන්විත විය.

4.1 **විධායක නිලධාරීන්**

I. ලේකම්වරයා
II. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් 02

} ශ්‍රී ලංකා අධිකරණ සේවය.

4.2 **මාණ්ඩලික නිලධාරීන්**

I. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තිය II ශ්‍රේණියට අයත් ගණකාධිකාරීවරයා.
II. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන විමර්ශන නිලධාරියා සහ සහකාර විමර්ශන නිලධාරියා.
III. උපලේඛනගත රජයේ සේවයට අයත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්.
IV. රජයේ ඒකාබද්ධ සේවයට අයත් භාෂා පරිවර්තක නිලධාරීනිය.

4.3 **කලමනාකරණ සහකාර සේවය**

I. උපලේඛනගත රජයේ සේවයට අයත් අධිකරණ භාෂණ පරිවර්තක නිලධාරීන්.
II. උපලේඛනගත රජයේ සේවයට අයත් අධිකරණ කලමනාකරණ සහකාර සේවයේ ලිපිකරුවන්, ලඝුලේඛකයන් සහ යතුරු ලේඛකයන්.
III. රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයට අයත් නිලධාරීන්.

4.4 **කණිෂ්ඨ කාර්ය මණ්ඩලය**

I. රජයේ ඒකාබද්ධ සේවයට අයත් රියැදුරන්
II. කාර්යාල කාර්ය සහායකවරුන්.

**අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා වෙනත් ව්‍යවස්ථාපිත නීති මගින් පැවරී ඇති කාර්යභාරය පහත සඳහන් පරිදිය.**

01. මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් වන දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු හා විනය පාලනය.

02. මුස්ලිම් ප්‍රජාවගේ පවුල් අධිකරණ බලය හොබවන ක්වාසිවරුන් පත් කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පොලිස් කොමිෂන් සභාවේ තීරණයන් පිළිබඳ අභියාචනා අධිකාරිය වන පරිපාලන විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා හා සාමාජිකයින් පත්කිරීම.

04. නොසලකා හරින ලද දෙමාපියන්හට දරුවන්ගෙන් නඩත්තු ඉල්ලා සිටීමේ ඉල්ලීම් විනිශ්චය කෙරෙන වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ සභාපතිවරයා හා සාමාජිකයින් පත් කිරීම.

05. අධිකරණ කාර්ය මණ්ඩලයන්හි සේවය කරන උපලේඛනගත සේවයේ රජයේ නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම සහ විනය පාලනය.

06. සමස්ථ අධිකරණ පරිපාලනය මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම.

## යුක්තිය පසිඳලීමේ කාර්යය පහසු කිරීම, කාර්යක්ෂම කිරීම, වේගවත් කිරීම සහ ශක්තිමත් කිරීමෙහි ලා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග හා එහි ප්‍රගතිය

01. විධායකය හා ව්‍යවස්ථාදායකය සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අධිකරණයේ ස්වාධීනතාව ආරක්ෂා කර ගනිමින් ශ්‍රී ලංකාවේ යහ පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය අධිකරණයේ සහාය ලබාදීමට අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියා කරමින් සිටී.

02. අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ පාලනය වන ආයතන හා එය හා සම්බන්ධ ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩ නඟා ගනිමින් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා වේගවත් කිරීමට මනා දායකත්වයක් ලබාදී ඇත.

03. නඩු විසඳීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම හේතුවෙන් අධිකරණයන්හි ගොඩ ගැසී ඇති නඩු ප්‍රමාණය කොපමණද යන්න හඳුනා ගැනීම පිණිස දිවයිනේ සියළු දිසා අධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල පවතින නඩු කාලසීමාවන් අනුව වර්ග කරවා ඊට අදාල සංඛ්‍යා ලේඛණ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ගෙන්වා පළමුව අවුරුදු 30 ට වඩා පැරණි සිවිල් නඩු පවතින දිසා අධිකරණ හඳුනාගෙන එම අධිකරණයන් වෙත නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම හේතුවෙන් මේ වනවිට එකී නඩු කටයුතු බොහොමයක් අවසන්ව ඇත.

04. ඒ අකාරයට අධිකරණයන්හි ගොඩ ගැසී ඇති අනෙකුත් පැරණි නඩු ඉහත පරිදි කාලසීමාවන් අනුව වර්ග කර ඒවා අවසන් කිරීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග මේ වනවිට හඳුන්වා දී ඇති අතර, ඒ සම්බන්ධයෙන් මේ වනවිට විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

05. මහාධිකරණ කලාප වල සිවිල් අභියාචන මහාධිකරණ පිහිටුවීම මගින් සිවිල් අභියාචන නඩු විසඳීම කඩිනම් වීම මගින් එම නඩු බොහෝමයක් අවසන් කිරීමට හැකිවී ඇත.

06. 2010 නොවැම්බර් මස 10 වන දිනැති අංක 1679/40 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රකාශිත නව මහේස්ත්‍රාත් අධිකරණ බොහොමයක් මේ වනවිට ආරම්භ කිරීම හේතුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයන්හි විසඳනු ලබන අපරාධ සහ අනෙකුත් නඩු ක්‍රියාවලියද වේගවත් වී ඇත.

07. සිවිල් සහ අපරාධ නඩු කටයුතු කඩිනම් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා නඩු කටයුතු අධික අධිකරණයන් සඳහා පළපුරුදු, දක්ෂ විනිශ්චයකාරවරුන් පත්කර ඇති අතර, විනිසුරු පුරප්පාඩු ඇති නොවීමට සහ අළුතින් ආරම්භ කරන අධිකරණයන් සඳහා නවක අධිකරණ නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීමට පියවර ගෙන ඇත. 2012 වර්ෂයේදී අධිකරණ නිලධාරීන් සඳහා වන පුරප්පාඩු පිරවීම සඳහා විභාගයක් පවත්වා බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවන ලදී.

08. විනිශ්චයකාරවරුන්ගේ දැනුම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, ආකල්ප වර්ධනය කිරීම සඳහාත් අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ පිහිටුවා ඇති "විනිශ්චයකාරවරුන්ගේ ආයතනය" මගින් සෑම සති අන්තයකම පුහුණු කිරීම්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය පවත්වනු ලැබේ. විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු සහ විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු "විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ" සම අධ්‍යක්ෂවරුන් වශයෙන් ක්‍රියා කරනු ලැබේ.

09. නඩු කටයුතු කඩිනමින් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස විනිශ්චයකාරවරුන්ට විදේශ පුහුණුවද ලබා දීම ආරම්භ කර ඇත. එහි පළමු පියවර වශයෙන් ඉන්දියාවේ බෝපාල්හි පිහිටුවා ඇති ජාතික අධිකරණ අධ්‍යයන ආයතනය වෙත විනිශ්චයකාරවරුන් 30 දෙනා බැගින් වූ කණ්ඩායම් 02 ක්2012 ජනවාරි සහ අගෝස්තු මාස වල යැවීමටද විනිශ්චයකාරවරුන් 20 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 2012 අපේ%ල් මස ඇමරිකා එක්සත් ජනපදයේ USPTO Hedquarters Alexandria Virginia වෙත යැවීමටද, විනිශ්චයකාරවරුන් 15 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 2012 අගෝස්තු මස සිංගප්පූරුව වෙත යැවීමටද කටයුතු කර ඇත.

10. අධිකරණ වලට පරිගණක ලබා දීම තුලින් අධිකරණ වල කාර්යාල පරිපාලන කටයුතු නවීන තාක්ෂණය අනුව ක%මවත්ව සහ කාර්යක්ෂමව කර ගැනීමට කටයුතු කර

ඇති අතර දිවයින පුරා සිටින සියළුම මහේස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන් වීඩියෝ තාක්ෂණය මගින් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.

11. විනිශ්චයකාරවරුන්ගෙන් නිසි සේවයක් ලබා ගැනීම අරමුණු කරමින් ඔවුන් තෘප්තිමත් කිරීම පිණිස ඔවුන්හට විධිමත් උසස්වීම් කාර්ය පටිපාටියක් හඳුන්වා දී ඇති අතර, වාර්ෂික වැටුප් වර්ධක නිසි පරිදි ලබාදීම, ජ්‍යෙෂ්ඨත්වය අනුව සුදුසු සේවා ස්ථාන ලබාදීම, නිල නිවාස සහ නිල රථ ආදී පහසුකම් ලබා දීමට මැදිහත් වීම වැනි ක්‍රියා මාර්ග අනුගමනය කිරීම තුලින් යහපත් ප්‍රතිඵල අත්කර ගනිමින් සිටී.

12. විනිශ්චයකාරවරුන්ට විරුද්ධව ලැබෙන පැමිණිලි පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු කරන අතර, ඒවා සම්බන්ධයෙන් විමර්ෂණ පැවැත්වීම සහ ඉන් හෙළිවන කරුණු අනුව විනය පරීක්ෂණ පැවැත්වීම ආදී විනය ක්‍රියාමාර්ග සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලබයි.

13. අධිකරණයෙන් මහජනතාවට ඉටුවිය යුතු සේවය උසස් අන්දමින් ලබාදීමට ක්‍රියා කිරීමේදී විනිශ්චයකාරවරුන් මෙන්ම අධිකරණයේ අනෙකුත් කාර්ය මණ්ඩලයන්හි තත්ත්වයද උසස් විය යුතු බවට අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිගෙන ඇත. ඒ අනුව උපලේඛණගත රජයේ නිලධරයන් අධිකරණවල සේවයට බඳවා ගැනීමේදී එකී බඳවා ගැනීම් විධිමත් පරිපාටියකට අනුවම සිදු කරනු ලැබේ. ඊට අමතරව උපලේඛණගත සේවයට අයත් සියළු සේවාවන්හි විධිමත් උසස්වීම් පරිපාටියක් ක්‍රියාත්මක කරනු ලැබේ. එක් එක් සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් ආදී සියළු විභාග නියමිත කාලසීමාවන් තුලදී පැවැත්වීමට සියළු පියවර ගෙන ඇත.

14. ඒ අනුව 2012 වසර තුලදී උපලේඛණගත රජයේ නිලධරයන්ගේ සේවයට අදාලව පහත සඳහන් උසස්වීම් හා බඳවා ගැනීම් සිදුකර ඇත.

I. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවාවේ I ශ්‍රේණියේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා එම සේවාවේ II ශ්‍රේණියේ නිලධාරින් හට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා කුසලතාව මත 18 දෙනෙකුට උසස්වීම් ලබා දී ඇත.

II. අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් අධිකරණ ලිපිකරු පුරප්පාඩු පිරවීම සඳහා නියමිත බඳවා ගැනීම් පරිපාටියට අනුව සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවා පවත්වනු ලැබූ විවDත තරÕ විභාගයෙන් ලිපිකරුවන් (සිංහල) 196 දෙනෙකුටද ලිපිකරුවන් (දෙමළ) 50 දෙනෙකුටද පත්වීම් ලබා දී ඇත.

III. අධිකරණවල පැවති භාෂණ පරිවර්තක පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම් පරිපාටියට අනුව සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවා තරග විභාගයක් පැවැත්වීමට පියවර ගෙන ඇත.මෙතෙක් බඳවා ගැනීමක් සිදු කර නැත.

IV. අධිකරණවල පවතින ලඝුලේඛක පුරප්පාඩු පිරවීම සඳහා උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ ව්‍යවස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා ඇති අයගෙන් විභාගයක් පවත්වා එයින් සමත් 21 දෙනෙකු බඳවා ගෙන ඇත.

V. අධිකරණ වල පවතින යතුරු ලේඛක පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලැබූ අයගෙන් අයදුම්පත් කැඳවා තරÕ විභාගයක් පවත්වා යතුරු ලේඛකයින් (සිංහල) 64 ක්ද ලඝු ලේඛකයින් (ඉංගී%සි) 07 දෙනෙක්ද අ¿තින් බඳවා ගෙන ඇත.

VI. ඊට අමතරව අධිකරණ වල සේවය කරනු ලබන සුදුසුකම් ලත් කනිෂ්ඨ සේවකයින් අතර පවත්වනු ලබන වාචික පරීක්ෂණ මගින් සුදුසුකම් ලැබූ 119 දෙනෙකුට අ¿තින් පොත් බැඳුම්කරුවන් වශයෙන් උසස්වීම් ලබා දී ඇත.

15. ඊට අමතරව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහල නැංවීම අරමුණු කොට එකී සේවයට අයත් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවය, අධිකරණ කළමනාකරණ සහකාර සේවය, අධිකරණ භාෂණ පරිවර්තක සේවය සහ අධිකරණ පොත් බැඳුම්කාර සේවය සඳහා උපලේඛණගත නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය මගින් පුහුණු පාඨමාලා පැවැත්වීම ආරම්භ කර එම සේවාවන් සඳහා පුහුණුවීම් ලබා දී ඇත

16. උපලේඛණගත රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන්ද අධිකරණ සේවා කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු කරන අතර, ඒවා සම්බන්ධයෙන්ද විමර්ෂණ පැවැත්වීම සහ ඉන් හෙළිවන කරුණු අනුව විනය පරීක්ෂණ පැවැත්වීම ආදී විනය ක්‍රියා මාර්ග සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලබයි.

17. අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමෙහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා එහි වර්තමාන සාමාජිකත්වය සහ නිලධාරී මණ්ඩලය දැඩි කැප වීමෙන් කටයුතු කරනු ලබන අතර, ඒ තුලින් මහජනතාව තුල නීතිය කෙරෙහි ඇති විශ්වාසය පලුදු නොවන ආකාරයට කටයුතු කිරීමට දැඩි අදිටනින් යුතුව ක්‍රියා කරනු ලැබේ.

**2012 වර්ෂය වෙනුවෙන් වූ ඇස්තමේන්තුවේ එක්එක් වැය විෂයයන් යටතේ ලද ශුද්ධ ප්‍රතිපාදනයන්, ශුද්ධ වියදම් සහ ශේෂයන් පිළිබඳ ලේඛනය.**

රුපියල්

| වැය විෂය අංකය | පුනරාවර්තන වියදම්වල විස්තර | ශුද්ධ වෙනස්කිරීම් | ශුද්ධ වියදම් | ශේෂය |
|---|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 15,850,000.00 | 15,336,824.00 | 513,176.00 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 486,349.00 | 472,844.00 | 13,505.00 |
| 1003 | වෙනත් දීමනා | 10,677,000.00 | 10,595,084.00 | 81,916.00 |
| 1101 | දේශීය ගමන් වියදම් | 250,000.00 | 249,498.00 | 502.00 |
| 1102 | විදේශීය ගමන් වියදම් | 100,000.00 | 95,136.00 | 4,864.00 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 900,000.00 | 897,904.00 | 2,096.00 |
| 1202 | ඉන්ධන | 1,988,000.00 | 1,943,588.00 | 44,412.00 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 50,000.00 | 47,357.00 | 2,643.00 |
| 1301 | වාහන නඩත්තු | 800,000.00 | 799,941.00 | 59.00 |
| 1302 | යන්ත්‍ර උපකරණ නඩත්තුව | 350,000.00 | 322,889.00 | 27,111.00 |
| 1303 | ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තුව | 242,000.00 | 230,564.00 | 11,436.00 |
| 1402 | තැපැල් හා සංනිවේදන | 993,651.00 | 993,651.00 | - |
| 1403 | විදුලිය හා ජලය | 760,000.00 | 745,165.00 | 14,835.00 |
| 1404 | බදුකුලී හා පළාත් පාලන බදු | 160,000.00 | 155,556.00 | 4,444.00 |
| 1405 | වෙනත් | 3,700,000.00 | 2,639,447.00 | 1,060,553.00 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 60,000.00 | 58,904.00 | 1,096.00 |
| 2001 | ගොඩනැගිලි වැඩි දියුණු කිරීම | 50,000.00 | - | 50,000.00 |
| 2003 | වාහන වැඩිදියුණු කිරීම | 100,000.00 | - | 100,000.00 |
| 2102 | ගෘහ භාණ්ඩ උපකරණ මිලට ගැනීම | 50,000.00 | 48,500.00 | 1,500.00 |
| 2103 | යන්ත්‍ර උපකරණ මිලට ගැනීම | 200,000.00 | 184,240.00 | 15,760.00 |
| 2401 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 100,000.00 | 44,550.00 | 55,450.00 |
| 2502 | ආයෝජන | 50,000,000.00 | - | 50,000,000.00 |
| | මුළු එකතුව | **87,867,000.00** | **35,861.642.00** | **52,005,358.00** |

ඩී.ජී.එස්.ඒ.5

# වැඩ සටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| මූල්‍යකරණය | | වැඩසටහන 1 * | | වැඩසටහන 2 * | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය ** 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය ** 3 | සත්‍ය වියදම 4 | ශුද්ධ ප්‍රතිපාදනය ** 5 | සත්‍ය වියදම 6 | වියදමේ ප්‍රතිශතය *** |
| | | රු: | රු: | රු: | රු: | රු: | රු: | % |
| 11 | දේශීය අරමුදල් | 86,640,000.00 | 34,711,850.00 | 0.00 | 0.00 | 86,640,000.00 | 34,711,850.00 | 40.00 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 1,227,000.00 | 1,149,792.00 | 0.00 | 0.00 | 1,227,000.00 | 1,149,792.00 | 94.00 |
| | එකතුව | **87,867,000.00** | **35,861,642.00** | **0.00** | **0.00** | **87,867,000.00** | **35,861,642.00** | **41.00** |

* ඩී.ජී.එස්.ඒ. 5 (1) අනුව එක් එක් වැටසටහන් යටතේ ඇති අගයන් ඇතුලත් කරන්න.

** ඩී.ජී.එස්.ඒ.1 හි 4 වන තීරුවට යොමුගත ප්‍රතිපාදන

*** දශමස්ථාන රහිතව % සඳහන් කරන්න.

ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය : 2013.03.21

**පුනරාවර්තන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම**
**(ඩී.ජී.එස්.ඒ. 3 හි 6 තීරුවට යොමුගත වේ.)**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | පුනරාවර්තන වියදම්වල විස්තරය | වෙනස ඉතිරිකිරීම් හා (ඉක්මවීම්)රු:* | ඉතිරිවීම් ප්‍රතිශතය % ** | පැහැදිලි කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | | 1001 | 11 | වැටුප් හා වේතන | 513,175.00 | 3 | |
| | | | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 13,504.00 | 3 | |
| | | | 1003 | 11 | වෙනත් දීමනා | 4,707.00 | 0 | |
| | | | 1003 | 21 | වෙනත් දීමනා | 77,208.00 | 6 | මාසික දීමනාව සඳහා ප්‍රමාණවත් නොවීම |
| | | | 1101 | 11 | දේශීය ගමන් වියදම් | 502.00 | 0 | |
| | | | 1102 | 11 | විදේශීය ගමන් වියදම් | 4,864.00 | 5 | |
| | | | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 2,095.00 | 0 | |
| | | | 1202 | 11 | ඉන්ධන | 44,412.00 | 2 | |
| | | | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 2,643.00 | 5 | |
| | | | 1301 | 11 | වාහන නඩත්තුව | 58.00 | 0 | |
| | | | 1302 | 11 | යන්ත්‍ර උපකරණ නඩත්තුව | 27,111.00 | 8 | අත්‍යාවශ්‍යම නඩත්තු පමණක් කිරීම |
| | | | 1303 | 11 | ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තුව | 11,435.00 | 5 | |
| | | | 1402 | 11 | තැපැල් හා සංනිවේදන | 0.00 | 0 | |
| | | | 1403 | 11 | විදුලිය හා ජලය | 14,834.00 | 2 | |
| | | | 1404 | 11 | බදුකුලී හා පළාත් පාලන බදු | 4,444.00 | 3 | |
| | | | 1405 | 11 | වෙනත් | 1,060,552.00 | 29 | සැලසුම් කල පරිදි කා.කඩඉම් හා බඳවා ගැනීම් විභාග පැවැත්වීමට නොහැකි වීම. |
| | | | 1506 | 11 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 1,096.00 | 2 | |

- චක්‍රලේඛයේ 5 වන ඡේදය බලන්න.

ඩී.ජී.එස්.ජී.6 (1)

**මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම**

**(ඩී.ජී.එස්.ජී.4 හි 5 තීරුවට යොමුගත වේ.)**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | මූලධන වියදම්වල විස්තර | වෙනස ඉතිරි කිරීම් හා (ඉක්මවීම) රු:* | ඉතිරිවීම් ප්‍රතිශතය % ** | පැහැදිලි කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | | 2001 | 11 | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | 50,000.00 | 100 | අවශ්‍යතාවයක් ඇති නොවීම |
| | | | 2003 | 11 | වාහන වැඩිදියුණු කිරීම | 100,000.00 | 100 | අවශ්‍යතාවයක් ඇති නොවීම |
| | | | 2102 | 11 | ගෘහ භාණ්ඩ උපකරණ මිලට ගැනීම | 1,500.00 | 3 | |
| | | | 2103 | 11 | යන්ත්‍ර උපකරණ මිලට ගැනීම | 15,760.00 | 8 | ඉතිරි මුදල මිලදී ගැනීමකට ප්‍රමාණවත් නොවීම |
| | | | 2401 | 11 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 55,450.00 | 55 | සුදුසු වැඩසටහන් ඉදිරිපත් නොවීම |
| | | | 2502 | 11 | ආයෝජන | 50,000,000.00 | 100 | |

* චක්‍රලේඛයේ 5 වන ඡේදය බලන්න.

** ඉතිරිවීම් ප්‍රතිශතය දශමස්ථාන රහිතව දක්වන්න.

ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය : 2013.03.21

**පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය**
**(මු.රෙ.106 හා 113 යටතේ වන පාඩු)**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07 වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන.

(1) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපා හැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු:) |
|---|---|---|---|
| රු: 25,000.00 | අඩු | නැත | |
| රු: 25,000.01 | වැඩි | --------------------------------------- | |
| | | ===================================== | |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය රු:

1.
2. නැත
3.
4. ---------------

එකතුව ==============

(2) නව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු:) |
|---|---|---|---|
| රු: 25,000.00 | අඩු | නැත | |
| රු: 25,000.01 | වැඩි | --------------------------------------- | |
| | | ===================================== | |

(2) අනුව කාල විශ්ලේෂණය

| | සිද්ධි සංඛ්‍යාව | |
|---|---|---|
| වසර 5 ට අඩු | | |
| ගණන | රු: | |
| | සිද්ධි සංඛ්‍යාව | |
| වසර 5-10 | | |
| | ගණන | රු: |
| | සිද්ධි සංඛ්‍යාව | |
| වසර 10 ට වැඩි | | |
| | ගණන | රු: |

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය රු:

1.
2.
3.
4. ------------------

එකතුව ================

සටහන : වැය විෂය 1701 යටතේ වර්ෂය තුල ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ.106 යටතේ වන හානි හා මු.රෙ.113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුලත් කළ යුතුය.

**අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2012**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය * | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත අනුව 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2012.01.01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | 2012.12.31 දිනට අවසාන ශේෂය | |
| | | රු: | රු: | රු: | රු: | රු: |
| රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් | 8493/0/0/00701 | 9,457,277.81 | 2,006,649.12 | 3,204,575.17 | 8,259,351.76 | 8,259,351.76 |
| අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| විවිධ අත්තිකාරම් | | | | | | |
| තැන්පත් | | | | | | |
| පොදු තැන්පත් | 6000/0/0/02/032 | 2,829.00 | 123,894.38 | 124,149.38 | 3,084.00 | 3,084.00 |
| අනෙකුත් තැන්පත් | | | | | | |

මු.රෙ.506 (2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය, පුද්ගල ගිණුම්වල අදාල ලැයිස්තු සමග සසඳා, එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කල බවට තහවුරු කරමි.

* තැන්පතු ගිණුම් අංක සටහන් කිරීමේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ඇතුලත් සම්පූර්ණ ගිණුම් අංකය ඇතුලත් කලයුතු අතර, අක්‍රියව පවතින ගිණුම්ද හෙළිදරව් කල යුතුය.

ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය : 2013.03.21

සටහන (111)

**<u>අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව - 2012</u>**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ පොත් අනුව | | | | | 2012.12.31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු: |
|---|---|---|---|---|---|
| ගිණුම් අංකය | 2012.01.01 දිනට ආරම්භක ශේෂය රු: | වර්ෂය තුල මුළු හර කිරීම් රු: | වර්ෂය තුල මුළු බැර කිරීම් රු: | 2012.12.31 දිනට අවසාන ශේෂය රු: | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7002/0122/0011 | 1,906,459.01 | 0.00 | 1,906,459.01 | 0.00 | |
| 7002/0122/0012 | 0.00 | 56,984,220.93 | 47,676,262.54 | 9,307,958.39 | 12,106,760.39 |

1. ඉහත 5 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න
(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2012.12.31 දිනට මුදල් ශේෂය 2,798,802.00
(2) වෙනත් හේතු :……………
-------------
2,798,802.00
===========

2. ඉහත 5 හි දැක්වෙන ශේෂයෙහි සංයුතිය පහත සඳහන් පරිදි විස්තර කරන්න.

(1) නොපියවූ උප අග්‍රිම (අත්තිකාරම්) එකතුව
(2) ගිණුම් සාරාංශ සැකසීමේ දෝෂ (ඇතොත්)
-------------
===========

මෙම ශේෂයන් වාර්තාව අත්සන් කරන දින වනවිට පියවා ඇත්නම් ඒ බවද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය : 2013.03.21

සටහන (IV)- (ආ)

**2007.09.05 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2007/05 හි (1) වැනි**
**ඡේදයේ උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද නව බැංකු ගිණුම් පිළිබඳ**
**2012.12.31 දිනට තත්ත්ව වාර්තාව**

ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අධිකරණ සේවා කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 07

| බැංකුවේ නම | ගිණුම් අංකය | 2012.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු: | 2012.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය රු: | 2012.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 06 ට වැඩි ඇනොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කල මාසය |
|---|---|---|---|---|---|
| මහජන බැංකුව, වේල්ල වීදිය | 297100199025039 | 10,133,150.39 | 9,307,958.39 | 30.00 | 2012 දෙසැම්බර් |
| වේල්ලවීදිය. | | | | | |
| | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය : 2013.03.21

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

<u>විගණන විමසුම් - AUDIT QUERY</u>

විමසීම් අංකය :- Query JP/C/අධි සේ කො ස/විගි/07/05/2012

නිකුත් කරන දිනය Date of Issue :- 2013 මැයි 20 දින

වෙතටයි :- Addressed to ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,

විෂයය :- Subject <u>විසර්ජන ගිණුම් පරීක්ෂාව - 2012</u>

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/ විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
**<u>This is only query calling for information for clarification and not an audit report.</u>**

යථෝක්ත විසර්ජන ගිණුම සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂණයේදී පහත කරුණු අනාවරණය විය.

**01.** <u>අයවැය පාලනය.</u>

නියමිත කරුණු සොයා බැලීමකින් තොරව අයි ඇස්තමේන්තු කිරීම හෝ කළමණාකරනයේ අදාල කාර්ය සාධන ක්‍රියාවලිය නිශ්චිත කාලය තුල සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් හෝ මෙම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(අ).** <u>සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවීම.</u>

පහත සඳහන් වැය විෂයයන් සඳහා වෙන්කර තිබුණු මුළු ප්‍රතිපාදනයට ඉතිරි වී තිබුණි.

| වැය විෂයය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිම් | ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | (%) |
| 07-01-01-2001 | 50.000 | 50.000 | 100 |
| 07-01-01-2003 | 100.000 | 100.000 | 100 |
| 07-01-01-2502 | 50.000.000 | 50.000.000 | 100 |

(ආ). ප්‍රතිපාදන ඌන උපයෝජනය.

පහත සඳහන් වැය විෂයයන් යටතේ වෙන්කර තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 29 % සිට 55% දක්වා ප්‍රමාණයක ඉතිරි වී තිබුණි.

| වැය විෂයය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම | ඉතිරිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | (%) |
| 07-01-01-1405 | 3.700.000 | 2.687.158 | 1.012.842 | 27 |
| 07-01-01-2401 | 100.000 | 44.550 | 55.450 | 55 |

(02). බැරකම් වාර්තා කිරීම.

2012 දෙසැම්බර් 31 දිනට විසර්ජන ගිණුම් අනුව රු. 324.972 ක් බැරකම් ලෙස දක්වා තිබූ අතර. පහත සඳහන් වැය විෂයයන්හි ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි.

| වැය විෂයය | 2012.12.31 දිනට ඉතිරිය. | 2012.12.31 දිනට බැරකම්. | ඉතිරිය ඉක්මවූ බැරකම්. |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 07-01-01-1003-21 | 77.208 | 209.750 | 132.542 |
| 07-01-01-1003-11 | 4.707 | 23.744 | 19.037 |
| 07-01-01-1402 | - | 67.948 | 67.948 |
| | | | --------- |
| | | | 219,527 |
| | | | ===== |

(03.) නොසැසඳීම්.

වැය ලෙජරය අනුව වැය විෂයයනගෙ ඉතිරිය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල වියදම් ඉතිරිය සමඟ සැසඳීමේදී පහත සඳහන් වෙනස්කම් දක්නට ලැබුණි.

| වැය විෂයය | පරිගණක මුද්‍රිත සටහන් අනුව ඉතිරිය. | වැය ලෙජරය අනුව ඉතිරිය |
|---|---|---|
| | රු. | රු. |
| 7-01-01-1405 | 1.060.553 | 1.012.842 |

4. නිවැරිදි නොකළ වෙනස්කම්.

අංක 7002/0122/0012 දරණ අග්‍රිම ගිණුම් 2012 දෙසැම්බර් 31 දිනට වූ රු. 9.307.958.39 ක අවසන් මුදල් ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව වූ රු. 12.106.760.39 ක ශේෂය අතර වෙනසට හේතු මොනවාද යන්න නිරීක්ෂණය නොවිණි.

5. වැය ලෙජරය විසර්ජන ගිණුම හා නොසැසඳීම්.

වැය ලෙජරය අනුව පුනරාවර්තන වියදම් රු. 35.867.363 ක් වූ අතර විසර්ජන ගිණුම් අනුව එම වටිනාකම රු. 35.584.352 ක් වූයෙන් රු. 283.011 කින් වැය ලෙජරය හා ගිණුම් නොසැසඳුනි.

6. හානි හා පාඩු.

හානි පාඩු ලේඛනයේ ඇතුලත් පහත සඳහන් හානි හා පාඩු අයකරගෙන නොතිබූ අතර. විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණ විස්තර පහත දැක්වේ.

| දිනය. | හානි විස්තරය. | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| 2000.08.25 | 17-9554 | 12.300 |
| 2001.05.04 | 300-6156 | 65.000 |

7. ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර විචලනය.

ශීර්ෂය අනුව පහත සඳහන් වැය විෂයයන්හි විචලනය ප්‍රතිශතයක් ලෙස පහත දැක්වෙන අතර, [illegible] පිළිගැනීමට අපහසු වන්. මෙම විචලනයන් [illegible] ඇස්තමේන්තු කිරීමේ අඩු පාඩු වලින් පෙන්වා දේ.

| වැය විෂයය | වියදම් විස්තරය. | ඉතිරිවීම. | ප්‍රතිශතය (%) |
| --- | --- | --- | --- |
| 7-1-1-1003 | වේතන දීමනා | 77.208 | 6 |
| 7-1-1-1302 | යන්ත්‍ර උපකරණ නඩත්තුව | 27.111 | 8 |

8. ප්‍රතිපාදන අවුරා නොතැබීම.

(අ). 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.4 ඡේදය ප්‍රකාරව, පුනරාවර්තන වියදම් වලට අදාළ වැය විෂයයන්ගේ ඇස්තමේන්තු වටිනාකම වන රු. 30.310.000 ක් වූ ප්‍රමාණයෙන් සියයට 2 ක් වන රු. 606.200 ක් අවුරා තැබිය යුතු වුවද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව අවුරා තබා ඇති වටිනාකම රු.29.200 ක් වූයෙන් රු.577.000 ක් පුනරාවර්තන වියදම් අඩුවෙන් අවුරා තිබුණි.

(ආ). ඉහත සඳහන් චක්‍ර ලේඛය අනුව ප්‍රාග්ධන වැය විෂයයන්ගෙන් සියයට 9 ක් වූ . 4.545.000 ක් අවුරා තැබියයුතු වුවද, අවුරා තිබූ වටිනාකම රු. 4.500 ක් වීමෙන් රු. 4.540.500 ක් අඩුවෙන් අවුරා තිබුණි.

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියාමාර්ග විගණනය වෙත දන්වන මෙන් කාරුණිකව ඉල්ලමි.

ජේ. සුනිල් ශාන්ත

විගණන අධිකාරි

නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

ජේඑස්සී/ජ්සී/ජ්යු/2013 2013.05.

ජේ.සුනිල් ශාන්ත මහතා,
විගණන අධිකාරී,
රජයේ විගණන අංශය,
අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

**<u>විසර්ජන ගිණුම පරීක්ෂාව 2012</u>**

උක්ත කරුණට අදාලව ඔබගේ අංක ජේපී/සී/අධිසේකොස/විගි/07/05/2012 හා 2013.05.20 දින දරන විමසීම හා බැදේ.

**<u>01. (අ) මුළු ප්‍රතිපාදනයම ඉතිරිවීම</u>**

| | |
|---|---|
| වැය විෂය අංක 2001 ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | රු: 50,000.00 |
| වැය විෂය අංක 2003 වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | රු:100,000.00 |

ගොඩනැගිලි මෙන්ම වාහන සම්බන්ධ පුනරුත්ථාපන කාර්යයන් කල්තබා 100% ක් නිවැරදි ලෙස ඇස්තමේන්තු කිරීම මෙන්ම අවශ්‍යතාවයක් ඇතිවේදැයි පැවසීමද දුෂ්කරය. එහෙත් එවැනි අවශ්‍යතාවයක් උද්ගත වුවහොත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රතිපාදනයක් තිබිය යුතුය. එබැවින් ඉහත සඳහන් රු: 150,000.00 ක ප්‍රතිපාදනය සිදුවී ඇත. නමුත් 2012 වර්ෂය තුල -

ගොඩනැගිලි පුනරුත්ථාපනයක හෝ
වාහන පුනරුත්ථාපනයක

අවශ්‍යතාවයක් ඇතිවී නැති බැවින්, එම ප්‍රතිපාදනය ප්‍රයෝජනයට නොගෙන ඇත.

වැය විෂය අංක 2505 - මානව සම්පත් සංවර්ධනය ආයෝජන යටතේ වූ රු: 50,000,000.00 ක්වූ ප්‍රතිපාදනය අප කාර්යාලය මගින් ඉල්ලුම් කල අයවැය ඇස්තමේන්තුවේ ඉදිරිපත් කරන ලද්දක් නොවන අතර, ඒ ගැන තොරතුරු පැවසීමට නොදනී. (අප විසින් ඉදිරිපත් කල ඇස්තමේන්තුවේ පිටපතක් ඔබගේ බලා ගැනීම පිණිස මේ සමග අමුණමි.)(2012 අයවැය ඇස්තමේන්තු ගොනුවේ 13 හා 14 දරන ලේඛනවල පිටපත්).

එහෙත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කර අප වෙත එවා තිබූ දල ඇස්තමේන්තුවේ එම ප්‍රතිපාදනය සටහන්ව තිබූ අතර, එම ප්‍රතිපාදනයම අපද නැවත ඇතුලත් කර ඇත. 2012 අයවැය ගොනුවේ 4 a ලේඛනයද මේ සමග ඉදිරිපත් කරමි.

4 a දරන ලද ඇස්තමේන්තුව අනුව 13 සංශෝධිත ඇස්තමේන්තුව පිළියෙල කර ඇත.

**01. (ආ) ප්‍රතිපාදන ඌණ උපයෝජනය**

**වැය විෂයය අංකය 1405 යටතේ ප්‍රතිපාදනයෙන් 27% ක් ඉතිරිවීම**

අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් 2012 වර්ෂය තුල පැවැත්වීමට සැලසුම් කර තිබූ අධිකරණ උපලේඛන ගත සේවාවේ තනතුරුවලට බඳවා ගැනීම් විභාග හා අධිකරණ උපලේඛනගත සේවාවේ නිලධරයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම මත ඉතිරි වී ඇත. මේ තත්ත්වයට හේතු වූයේ 2012 වර්ෂයේ අග භාගයේ අධිකරණ සේවා කොමිෂන් සභාව හා සම්බන්ධ වූ අධිකරණ ක්ෂේත්‍රය තුල ඇති වූ අර්බුධකාරී තත්ත්වයන්ය.

**වැය විෂයය අංක 2401 දැනුම වර්ධනය යටතේ වූ ප්‍රතිපාදනයෙන් 55% ක් ඉතිරි වීම**

කාර්යාලයේ සේවයේ නියුතු වූ නිලධාරීන් සඳහා වූ දැනුම වර්ධනය කිරීමට අදාලව සුදුසු වැඩසටහන් ඉදිරිපත් නොවීම මත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට නොහැකි වීම මත රු: 55,450.00 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

**02. බැරකම් වාර්තා කිරීම**

**වැය විෂය අංක 1003 (21) විශේෂ නීති ප්‍රතිපාදන යටතේ අධිකරණ සේවා කොමිෂන් සභා සභාපති ඇතුළු අනෙක් සාමාජිකයන්ට ගෙවිය යුතු මාසික දීමනා**

මේ සඳහා වෙන්කොට තිබූ මුදල ප්‍රමාණවත් නොවූ බැවින් අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටියමුත්, 2012 වර්ෂය තුල එය නොලැබුණු අතර (එම ඉල්ලීමේ පිටපතක් මේ සමඟ ඔබගේ අවධානයට යොමු කරමි.) (2012 අතිරේක ප්‍රතිපාදන ගොනුවේ අංක 18 ලේඛනය.)

2013 වර්ෂය සඳහා වූ ප්‍රතිපාදනය රු: 1,227,000/- සිට 1,301,000/- දක්වා වැඩිකොට ඇත.

2008 වර්ෂයේ සිට පාර්ලිමේන්තු සම්මතයක් මත ගෙවනු ලබන මෙම දීමනා නොගෙවා සිටීමේ හැකියාවක් අප සතුව නැත.

<u>වැය විෂය අංක 1003 (11) රජයේ සේවකයන් සඳහා වන විවිධ දීමනා</u>

මේ යටතේ 2012 වර්ෂයේ ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත රු: 19,037.00 ක බැරකම් ඇතිවී ඇත. අනියම් සේවකයන්ගේ දෙසැම්බර් මස වැටුප්වලට අදාල ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව, නිදහස් දුම්රිය බලපත් ගාස්තු යනාදිය මේ යටතේ ගෙවා ඇත. මෙම වියදම්ද නොගෙවා සිටිය නොහැකි අතර, මේ සඳහා වන ප්‍රතිපාදනද 2013 වර්ෂය සඳහා රු: 7,000,000/- සිට රු: 8,000,000/- දක්වා වැඩි කරවා ගෙන ඇත.

<u>වැය විෂය අංක 1402 තැපැල් හා සංනිවේදන පහසුකම්</u>

මේ යටතේ ඇතුලත්ව ඇත්තේ දෙසැම්බර් මස දුරකථන බිල්පත් අගයන් වේ. මේ සම්බන්ධයෙන්ද අතිරේක ප්‍රතිපාදන ඉල්ලීමක් 2012.12.21 දින කර ඇත. (එම ඉල්ලීමේ පිටපතක් මේ සමඟ ඔබගේ අවධානයට යොමු කරමි.) (2012 අතිරේක ප්‍රතිපාදන ගොනුවේ අංක 24 වැනි ලේඛනය) එම ඉල්ලීම අනුව 2013 වර්ෂයේ 1402 වැය විෂය අංකය සඳහා ප්‍රතිපාදනය රු: 800,000/- සිට රු: 1,000,000/-දක්වා වැඩිකර ඇත.

<u>03. නොසැසඳීම</u>

<u>වැය විෂය අංක 1405 වෙනත් වියදම්</u>

මෙය අපගේ පහසුව සඳහා උප කොටස් 05කට බෙදා වෙන්කොට අතින් ලියන වැය ලෙජරයේ සටහන් කරයි. එහෙත් CIGAS වැඩ සටහනේ 1405 තනි විෂයකි.
අතින් ලියන වැය ලෙජරයට අනුව වර්ෂ අවසානයේ එක් එක් උප කොටස්වල වියදම්වල එකතුව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| කාර්යාල පිරිසිදු කිරීමේ සේවය සඳහා මුළු වියදම | රු: | 474,768.00 |
| විභාග සඳහා මුළු වියදම | රු: | 1,457,075. 89 |
| බඳවා ගැනීම් සඳහා මුළු වියදම | රු: | 309,421.60 |
| විමර්ශන කටයුතු වෙනුවෙන් වූ මුළු වියදම | රු: | 133,551.22 |
| වෙනත් වියදම් | රු: | 264,630.00 |
| 1405 වැය විෂය වෙනුවෙන් 2012 වර්ෂයේ මුළු වියදම | රු: | 2,639,447.29 |

| | | |
|---|---|---|
| 1405 වැය විෂය වෙනුවෙන් 2012 වර්ෂයේ මුළු ප්‍රතිපාදනය | රු: | 3,700,000.00 |
| <u>අඩුකලා:</u> | | |
| මුළු වියදම | රු: | 2,639,447.29 |
| 2012 වර්ෂය තුල ඉතිරිය | රු: | 1,060,552.71 |

භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශවලද / CIGAS වැඩ සටහන යටතේ අප සකස් කරන මාසික ගිණුම් ප්‍රකාශනවලද ඇත්තේ ඉහත අගයන්ම වේ.

එබැවින් ඔබගේ විමසීමේ සඳහන් ලෙස ශේෂ අතර වෙනසක් නොමැති බව තහවුරු කරමි.

**04. නිවැරදි නොකල වෙනස්කම්.**

**අංක 7002/0122/0012 දරන අග්‍රිම ගිණුම**

වෙනසට හේතු ලෙස පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරවමි.

| | | |
|---|---|---|
| 2012.06.19 හා.නි.ලේ.ගේ ගිණුමට චෙක් අංක 399786 මගින් යැවූ | රු: | 1,042,988.00 |
| 2012.11.01 හා.නි.ලේ.ගේ ගිණුමට චෙක් අංක 400296 මගින් යැවූ | රු: | 1,093,500.00 |
| 2012.12.24 හා.නි.ලේ.ගේ ගිණුමට චෙක් අංක 400414 මගින් යැවූ | රු: | 662,314.00 |
| වෙනස (12,106,760.39 - 9,307,958.39) | රු: | 2,798,802.00 |

ඉහත සඳහන් හා.නි.ලේ. වෙත යවන ලද මුදල් භාණ්ඩාගාර අග්‍රිම ප්‍රකාශ කල ඇතුලත් ගෙවීම මත මෙම වෙනස ඇති වී ඇත. ඒ පිළිබඳව අප විසින් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවන ලද ලේඛණයක පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි. (භාණ්ඩාගාර මුද්‍රිත ගිණුම් ප්‍රකාශ ගොනුවේ ඇති 2013.02.14 දින යවන ලද ලිපියේ පිටපත) මෙහි පිටපතක් ඔබ වෙතද යවා ඇත.

**05. වැය ලෙජරය විසර්ජන ගිණුම හා නොසැසඳීම**

වැය ලෙජරය අනුව පුනරාවර්තන වියදම පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 1001 | | - | 15,336,824.40 |
| 1002 | | - | 472,844.16 |
| 1003 | (11) | - | 9,445,292.03 |
| | (21) | - | 1,149,791.65 |
| 1101 | | - | 249,497.90 |
| 1102 | | - | 95,135.70 |
| 1201 | | - | 897,904.34 |
| 1202 | | - | 1,943,587.87 |
| 1203 | | - | 47,357.00 |
| 1301 | | - | 799,941.44 |
| 1302 | | - | 322,888.51 |
| 1303 | | - | 230,564.04 |

| | | |
|---|---|---|
| 1402 | - | 993,650.98 |
| 1403 | - | 745,165.13 |
| 1404 | - | 155,556.00 |
| 1405 | - | 2,639,447.29 |
| 1506 | - | 58,903.75 |
| එකතුව | - | 35,584,352.19 |

මේ අනුව ඔබගේ විමසීමේ සඳහන් ආකාරයට විසර්ජන ගිණුම හා වැය ලෙජරය ගිණුම නොසැසඳීමක් නැති බව තහවුරු කරමි.

අවශ්‍ය නම් වැය ලෙජරය පරීක්ෂා කර බැලිය හැක.

**06. හානි හා පාඩු**

ඔබ ලේඛනයේ ඉදිරිපත් කර ඇති විස්තර අනුව

2000.08.25 දින හා

2001.05.04 දින සිදුවූ හානි සම්බන්ධයෙන් ගන්නා ලද පියවර මොනවාදැයි දැනට සොයාගත නොහැක. එහෙත් හානි පාඩු ලේඛනය අනුව ඊට පසුව 2004.05.07 දින මේ සම්බන්ධයෙන් විගණනය කර ඇති බව පෙනේ. මෑත කාලීනව මෙම සිදුවීම්වලට අදාල තොරතුරු වාර්තා වී නොමැති අතර, ගබඩාවේ තැන්පත් කර ඇති මේ සම්බන්ධ ලිපිගොනු සොයා බලා අවශ්‍ය පියවර ගන්නා බවද දන්වමි.

**07. ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර විචලනය**

**වැය විෂය අංක 1003 (21) විශේෂ නීති ප්‍රතිපාදන යටතේ අධිකරණ සේවා කොමිෂන් සභා සභාපති ඇතුළු සාමාජිකයින්ගේ මාසික දීමනා**

මෙම විෂය යටතේ විශේෂ නීති ප්‍රතිපාදන මගින් 2010 වර්ෂයේ සිටම ලබාදී තිබුණේ රු: 12,27,000/- ක ප්‍රතිපාදනයකි. මෙම ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවන බවත්, එම ප්‍රතිපාදනය කොමිෂන් සභා සාමාජිකයින්ගේ මාසික වැටුප අනුව වැඩිවිය යුතු බවත්, අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත අප විසින් විටින් විට ඉල්ලීම් කර ඇත. මෙම ඉල්ලීම් අනුව ගරු ජනාධිපතිතුමා විසින් 2013 වර්ෂයේ සිට මෙම ප්‍රතිපාදනය 13,01,000/- දක්වා වැඩිකර ඇත. (ඉල්ලීම්වල පිටපත් මේ සමග යාකර ඇත. අතිරේක ප්‍රතිපාදන ගොනුවේ 18 හා 22 ලේඛණ) (2012 අයවැය ගොනුවේ අංක 10 ලේඛනය සමහ 13,14).

එවකට කොමිෂන් සභා සාමාජිකයින්ගේ මාසික දීමනාව වශයෙන් රු: 104,875/- ක් ගෙවිය යුතුව තිබිණ. එහෙත් ඉතිරිව තිබුණේ රු: 77,208/- ක ප්‍රතිපාදනයකි. මේ අනුව ගෙවීම කළ නොහැකි බව තවදුරටත් දන්වමි.

**වැය විෂය අංක 1302 යන්ත්‍ර උපකරණ නඩත්තුව**

| | | |
|---|---|---|
| මෙම විෂය යටතේ 2012 වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය | රු: | 350,000/- කි. |
| ශුද්ධ වියදම | රු: | 322,888.51 කි. |
| ඒ අනුව ඉතිරි ප්‍රතිපාදනය | රු: | 27,111.49 කි. |

විසර්ජන ගිණුමේ දක්වා ඇති පරිදි ඉතිරියට හේතුව අත්‍යාවශ්‍යම නඩත්තු පමණක් කිරීම බව නැවත අවධානය කරන අතර නිලධාරීන් විසින් පාවිච්චි කරනු ලබන යන්ත්‍ර උපකරණවල නඩත්තු අවශ්‍යතා කල්තබා 100% නිවැරදි ලෙස ඇස්තමේන්තු කල නොහැකි බවද අවධානය කරමි.

**08. ප්‍රතිපාදන අවුරා නොතැබීම.**

(අ) 2012 වර්ෂයේ අප ආයතනයේ පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව රු: 30,310,000/- ක් බව තහවුරු කරමි.

ඔබ සඳහන් කර ඇති ආකාරයට මෙම මුළු ඇස්තමේන්තුවේ 2% ක ප්‍රතිශතය (30310000 x 2/100)= වූ රු: 606,200/- කට අවුරා තැබිය යුතුය.

එහෙත් ඔබම සඳහන් කරන ජාතික අයවැය චක්‍රලේඛ 155 හි 2:1 ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි. එම ඡේදයට අනුව අප ආයතනයේ ප්‍රමුඛ ක්‍රියාකාරකම් අඛණ්ඩව හා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වන ලෙස යම් යම් වැය විෂයයන් සම්බන්ධයෙන් පමණක් 2% ක ඉතිරි කිරීම කර ඇති බව දන්වමි. (මෙම ලේඛනයේ පිටපතක් ඔබ වෙතද ලබාදී ඇත.)

**(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කර ඇත. ඒ අනුව,**

| | | |
|---|---|---|
| 2001 වැය විෂය යටතේ 9% ක්ද (රු: 50,000/- x 9/100) | = රු: | 4500/- |
| 2003 වැය විෂය යටතේ 9% ක්ද (රු: 100,000/- x 9/100) | = රු: | 9000/- |
| ද වශයෙන් මුළු අවුරා තැබීම | = රු: | 13500/- ක් වී ඇත. |

එහෙත් ජාතික අයවැය චක්‍රලේඛ 155 අනුව යමින්,

2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලට ගැනීමට වෙන්කර තිබූ රු: 50,000/- ක්වූ කුඩා ප්‍රතිපාදනයෙන්ද,

2103 යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලට ගැනීම වෙනුවෙන් වෙන්කර තිබූ රු: 200,000/- ක්වූ කුඩා ප්‍රතිපාදනයෙන්ද 9% ක ඉතිරිය නොකරන ලදී.

මීට අමතරව 2502 ආයෝජන වැය විෂය සම්බන්ධයෙන් දැනුවත් වී නොසිටි බැවින් චක්‍රලේඛනය ප්‍රකාරව 9% ක ඉතිරිය නොකරන ලදී.

අත්.කළේ. සිසිර රත්නායක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.
2013.06.03

අත්.කළේ. ජී.මැද්දෙගොඩගේ
සහකාර ලේකම් (මුදල්)
අධිකරණ සේවා කොමිෂන් සභාව.

# 2012 වර්ෂයට අදාළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

01. දිවයිනේ පිහිටි අධිකරණයන්හි නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

02. යුක්තිය පසිඳලීමේ කටයුතු ක්‍රමවත්ව හා අඩාල නොවී පවත්වාගෙන යාම සඳහා මුල් අවස්ථා අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා සඳහා දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු සහ ඔවුන්ගේ විනය පාලනය විධිමත්ව පවත්වාගෙන යාම.

03. පුරප්පාඩු සඳහා නවක අධිකරණ නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීමට පියවර ගැනීම සහ නැවත ඇතිවන පුරප්පාඩු සඳහා නවක අධිකරණ නිලධාරීන් බඳවා ගැනීම සඳහා විභාගයක් පැවැත්වීම.

04. විනිශ්චයකාරවරුන්ගේ දැනුම හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඔවුන්ගේ පුහුණු කටයුතු පුළුල් කිරීම.

05. මුස්ලිම් ප්‍රජාවගේ පවුල් අධිකරණ බලය හොබවන ක්වාසිවරුන් පත්කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය යාවත්කාලීනව හා විධිමත්ව පවත්වාගෙන යාම.

06. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පොලිස් කොමිෂන් සභාවේ තීරනයන් පිළිබඳ අභියාචනා අධිකාරිය වන පරිපාලන විනිශ්චය අධිකාරියේ සාමාජිකයින් පත්කිරීම, යාවත්කාලීනව පවත්වාගෙන යාම.

07. නොසලකා හරින ලද දෙමාපියන් හට දරුවන්ගෙන් නඩත්තු ඉල්ලා සිටීමේ ඉල්ලීම් විනිශ්චය කෙරෙන වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම, යාවත්කාලීනව පවත්වාගෙන යාම.

08. අධිකරණවල කාර්යාල කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අධිකරණ කාර්ය මණ්ඩලයන්හි සේවය කරන උපලේඛණගත සේවයේ රජයේ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සහ ඔවුන්ගේ උසස්වීම්, මාරු කිරීම් හා විනය පාලනය විධිමත්ව පවත්වාගෙන යාම.

09. උපලේඛනගත සේවයේ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා දැනුම වර්ධනය සඳහා ඔවුන්ව පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.

10. උපලේඛනගත සේවයේ රාජ්‍ය නිලධාරීන්ගේ තනතුරු උසස් කිරීම සහ කාර්යක්ෂමතා කඩඉම් සඳහා විභාග පැවැත්වීම.

## විගණන විමසුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග - 2012

### සංයුක්ත සැලැස්ම

මේ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබාගෙන 2014 වර්ෂයේ ජනවාරි මස පිළියෙල කිරීමට කටයුතු කරමි.

### වාර්ෂික කාර්ය සාධන වාර්තා

මෙය 2013.09.09 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත.

### අග්‍රිම ගිණුම

අග්‍රිම ගිණුමේ ශේෂයේ වෙනස මේ වනවිට භාණ්ඩාගාරය මගින් නිරවුල් කර ඇත.

### වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

අධිකරණ අමාත්‍යාංශය සතු මෝටර් රථයක් කෙටිකාලීනව අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත තාවකාලිකව මුදාහැර ඇති අතර, එය තාවකාලිකව මෙම කාර්යාලය වෙත පවරා දී ඇත.

### පාඩු හා හානි

2000.08.25 දින හා 2001.05.04 දින සිදුවී ඇති හානි සම්බන්ධ තොරතුරු මේ වනවිටත් පැරණි ලිපිගොනු ආශ්‍රයෙන් සොයා බැලීමට කටයුතු කර ඇත.

## මානව සම්පත් කළමනාකරණය

මෙම කාර්යාලයේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය නිලධාරීන් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත.

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

01. අධිකරණයන්හි පවතින නඩු පිළිබඳ සංඛ්‍යාලේඛණ මාසිකව ලබාගෙන එම සංඛ්‍යාලේඛණ පරිගණක ගතකර, එම නඩු කඩිනමින් විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

02. විසඳීම පමාවී, කල්ගත වී ඇති නඩු ඇති අධිකරණ හඳුනා ගැනීමට පියවර ගෙන එම නඩු කඩිනමින් අවසන් කිරීමට විශේෂ ක්‍රියා මාර්ග ගැනීම.

03. අළුතින් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අධිකරණ සඳහා අළුතින් ගොඩනැගිලි ඉදිකර, අවශ්‍ය භෞතික සම්පත් සැපයූ වහාම ඒ සඳහා අවශ්‍ය විනිසුරුවරුන් සහ කාර්ය මණ්ඩලය පත්කර නඩු කටයුතු ආරම්භ කිරීම.

04. විනිශ්චයකාරවරුන්ගේ කාර්යක්ෂමතාවය, දැනුම, ආකල්ප වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.

05. විනිශ්චයකාරවරුන්ට අදාල තොරතුරු පරිගණක ගතකර ගැනීම තුලින් ක්‍රමවත් අධීක්ෂණයක් පවත්වාගෙන යාම.

06. විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු ඇති නොවීම පිණිස ප්‍රමාණවත් අධිකරණ නිලධාරීන් සංඛ්‍යාවක් වාර්ෂිකව බඳවා ගැනීමට විභාග පැවැත්වීම සහ සුදුසුකම් ලත් අයගෙන් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.

07. විනිශ්චයකාරවරුන්ගේ සේවා තෘප්තිමත් භාවය වර්ධනයෙහි ලා ඔවුන්ගේ වැටුප් වර්ධක හා උසස්වීම් නිසි කලට ලබාදීම, ස්ථාන මාරුවීම් විධිමත් ක්‍රමවේදයකට අනුව සිදු කිරීම සහ විනය කටයුතු විධිමත්ව නොපමාව විසඳීමට පියවර ගැනීම.

08. අධිකරණයන්හි සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ දැනුම හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන

පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අමතර පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම.

09. අධිකරණ කාර්යාල කටයුතු අඩාල නොවීම සඳහා උපලේඛණගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කිරීම.

10. උපලේඛනගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කිරීම, ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සඳහා විභාග නිසිකලට පැවැත්වීමට කටයුතු කිරීම, විධිමත් ක්‍රියා පටිපාටියක් අනුව ඔවුන්ගේ ස්ථාන මාරු සිදු කිරීම සහ ඔවුන්ගේ විනය සම්බන්ධ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම.

***************